# - ගිරා සන්දේශය -

මුල් යුගයේ සන්දේශ හා සාපේක්ෂ ව බලන කල පරමාර්ථය වශයෙන් ගිරා සන්දේශය තුළ නව ආරක්, නවතාවක් දැකිය හැකි ය. ගිරා සන්දේශයේ මූලික ම අරමුණ මේ යැයි කියා පෙන්විය නො හැකි නමුත් එය බහුවිධ පරමාර්ථවලින් ගෙතී ඇති බව පැහැදිලි ය. ශ්‍රී ලංකාවේ සම්බුද්ධ දේශිතය කප් සුවහස් කල් රැක දීමටත්, එවකට ශ්‍රී ලංකාවේ රාජ්‍යය කළ සය වැනි පැරකුම්බා රජතුමාණන් ඇතුළු කොට සමස්ත ශ්‍රී ලංකාද්වීපය ම සතුරු බියෙන්, රෝග බියෙන් හා යක්ෂ බියෙන් රැකගන්නා ලෙස නාථ දෙවිඳුන්ගෙන් ඉල්ලීමටත්, තොටගමු විජයබා පරිවේණාධිපති ව වැඩ වාසය කළ ශ්‍රී රාහුල හිමියන්ට දැන්වීමත් ගිරා සන්දේශය තුළින් අපේක්ෂා කෙරෙයි.

ඒ අනුව රජු වර්ණනා කිරීම, දේවවාදය ඉස්මතු කිරීම, මහායාන මත දැරීම, සතුරු උවදුරු දුරු කිරීම, බෞද්ධාගම රැකගැනීම, අනාගත යහපත් රජෙකු ප්‍රාර්ථනා කිරීම යනාදි බහුවිධ අරමුණු ගිරාවේ දක්නා ලැබේ.

ගිරා සන්දේශයේ දූතයා ගිරවෙකි. ප්‍රතිග්‍රාහකයා බෞද්ධ භික්ෂුවකි. අපේක්ෂණය දෙවියන්ගේ ආශීර්වාදය යි. අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා පාර්ශ්ව ගණනාවක සහභාගිත්වය ගිරා සන්දේශකරුවා විසින් අපේක්ෂා කර ඇති බව පැහැදිලි ය. ගිරාව තුළ පොදු අරුතක් විද්‍යමාන වීම දක්නා ලැබේ. ශ්‍රී ලංකාව තුළ සම්බුද්ධ ධර්මය සුරැකිය යුතු වන්නේ සදාකාලික ව ම ය. රටවැසියන් වශයෙන් එය සුරැකිය යුතු වන්නේ ත්‍රෛකාලිකයෙන් ම ය. එබැවින් සන්දේශ කතුවරයෙකු ලෙස ගිරා සන්දේශකරු සිය අරමුණ කාල, දේශ වශයෙන් පොදු කොට සලකා එය සන්දේශය තුළට බහා ඉදිරිපත් කොට ඇත්තේ ය.

පොදු පරමාර්ථයක් ඉෂ්ටාර්ථය කොට ගත් ගිරා සන්දේශය ත්‍රෛකාලික පැවැත්මක්, දර්ශනයක් ද සහිත ව සන්දේශාත්මක බවින් ඔබ්බට ගිය උසස් කෘතියකි. එහි අරමුණ ම යහ පැවැත්මටත්, දර්ශනයටත් අත්වැල සපයයි. සාමාන්‍යයෙන් සන්දේශ කාව්‍යවලින් ඉටු වූයේ ලෞකික අරමුණක් මුදුන්පත් කරගැනීම වුව ද මෙම සන්දේශය තුළ සන්දේශ සම්ප්‍රදායේ ආගමික මුහුණුවර විදහාලයි. මෙම ලක්ෂණය තුළින් මුල් යුගයේ සන්දේශමය ලක්ෂණ විදහාලීමත්, නව දුරටත් එය පුළුල් කිරීමත් එයට එක් වූ වටිනාකමක් නො වන්නේ ද? එහෙත් ගිරාකරුවාගේ යම් යම් අරමුණු තුළ අනාගතයේ ජයබාහු කුමරු රජ කරවීමේ පරමාර්ථයක් තිබූ බව පෙනේ. කෝකිල සන්දේශයේ සපුමල් රජ කරවීමේ අරමුණු තිබුණු බව පෙනේ. පොදු අරමුණු සේ පෙනුණත් මේවා පෞද්ගලික දේශපාලන අවශ්‍යතා ය.

කෝට්ටේ යුගයේ විරචිත මෙම ගිරා සන්දේශයේ කතුවරයා පිළිබඳ ව නිශ්චිත අදහසක් නො මැත. එසේ වතුදු සන්දේශ බන්ධනයේ විවිධ අවස්ථාවලින් සහ ප්‍රතිග්‍රාහකත්වයෙන් කතුවරයා සමයසමයාන්තර දැනුමින් පෝෂණය වූ බෞද්ධවාදී අදහස්වලට ප්‍රමුඛස්ථානය දුන් කෙනෙකු බව පෙනී යයි.

ගිරා සන්දේශය රචනා වන්නේ ශ්‍රී ලංකාව රකින සය වැනි පැරකුම්බාවන් සහ හෙළ දිවයින ද සතුරු, රෝග, යක්ෂාදි බියෙන් දුරු කොට රකින ලෙස ඉල්ලීමට යි. එය ඉහත දී පැවසුවෙමු. ඉල්ලීම සිදු වන්නේ නාථ දෙවිඳුන් වෙතින් වුව ඊට මැදිහත්කරුවාණන් වශයෙන් යොදාගන්නේ සුසිල්වත් බෞද්ධ හිමි නමකි. එනම්, රාහුල හිමි යඃ

'සිංහල සාහිත්‍යයේ මේ ස්වර්ණ යුගය සිංහලයන්ට උදා කර දීමෙහිලා පුරෝගාමී වූ මහා ප්‍රාඥයන් අතර, මහා කිවිවරුන් අතර, ශිරෝමණී තත්පත්, මුදුන් තත්පත් අතිශය ආශ්චර්යවත් උතුමෙක් වෙයි. උන්වහන්සේ නම් තොටගමුවේ ෂඩ්භාෂා පරමේශ්වර ශ්‍රී රාහුල සංඝරාජ මාහිමියෝ ය. ශ්‍රී රාහුල සංඝ රාජ මාහිමියන් කඳවුරු කුලයෙහි උපන් කෙනෙකු බවත්, උතුරුමුළ මහ තෙරිඳු මුනුබුරු බවත්, තොටගමුවෙහි වුසූ බවත්, මහ කවියකු බවත්, හැම ශාස්ත්‍රීය විෂයයක් ගැන ම විශාරදයකු බවත්, පිරිසිදු සිල් ගුණයෙන් හෙබි උතුමකු බවත්, උන්වහන්සේ විසින් ම විරචිත කාව්‍යශේඛර පද්‍යයන්ගෙන් පැහැදිලි වෙයි. '

(කේ.ටී.ඩබ්. සුමනසූරිය - සැළලිහිණි සන්දේශය)

සන්දේශ ප්‍රතිග්‍රාහක ශ්‍රී රාහුල මාහිමියෝ ත්‍රිපිටක වාගීශ්වර භික්ෂුවකි. උන්වහන්සේ තුළ වූ මෙකී වෛශාරද්‍යය මතු නො ව බුද්ධාලම්බන ගෞරවය ද ජනතා නියෝජිත සන්දේශ කතුවරයාට මෙබඳු අපේක්ෂණයක් සිදු කිරීමට ඉවහල් වන්නට ඇතැයි සැලකිය හැකි ය. මේ මතය කොතෙක් දුරට සාධාරණ දැයි විමසන්නට ගිරා සන්දේශය පුරා පැනෙන බෞද්ධ ප්‍රතිපත්තීන් රැගත් ස්වාගාමික චින්තනය ඉවහල් වෙයි. බෞද්ධාගමික චින්තනය අන්ධ විශ්වාසය තරම් අපැහැදිලි නො වන අතර කෙලෙසුන්ගෙන් මිදීමට තරම් සුපැහැදිලි වේ. එබඳු ගිරා කවියකින් නැඟෙන්නේ පහන් සංවේගයකි; තැන්පත් සතුටකි. ගිරාකරුගේ බොදු පිළිවෙත් තුළින් හදවතට පහන් බවක් බුද්ධියට ප්‍රතිභාපූර්ණත්වයක් සම්මිශ්‍ර ව දනෙයි. එය ප්‍රශස්ත ය; ඇගයිය යුත්තේ ය.

ගිරාවේ ඇතැම් පද ගුත්තිලයේ ඇතැම් පද හා සැසඳෙයි. එබැවින් ගිරාවේ කතුවරයා පිළිබඳ ගැටලුවේ දී එය ගුත්තිල කාව්‍යයේ කතුවර වෑත්තෑවේ හිමියන්ගේ දැයි සැකයක් ඉපදුණ ද එය තර්කානුකූල නො වන්නකි. මන්ද, ගුත්තිලයේ මතු නො ව සමකාලීන පද්‍යාඛ්‍යාන ගණනාවක ම කරුණු ගිරා සඳෙස විසින් උකහාගෙන ඇති හෙයිනි.

ගුත්තිලය ලියූ වෑත්තෑවේ හිමි සැලකෙන්නේ ශ්‍රී රාහුල හිමිගේ ගෝලයෙකු ලෙසිනි; ශිෂ්‍යයෙකු ලෙසිනි. ගුත්තිලය ලියැවෙන්නේ ද ඒ දෙදෙනාගේ ගුරුගෝල ගැටුම අනුභූති කොටගෙන යි. කෝට්ටේ කාලය අවසන් වන විටත් මේ ගුරුගෝල ගැටුම නිරාකරණය වූ බවට සාක්ෂ්‍ය නැත. එහෙයින් ගිරා සන්දේශය වෑත්තෑවේ හිමිගේ කෘතියක් ලෙස නො සැලකිය හැකි ය.

කෙසේ වතුදු සමස්ත ගිරා සන්දේශය ම විමසා බලන කල මේ අප්‍රකට කවියා තුළින් ප්‍රකට වන්නා වූ, අනිවාර්යයෙන් ම විවරණය කළ යුතු අප්‍රමාණ ප්‍රතිභාවක්, අනන්ත පරිකල්පනයක් දක්නා ලැබේ. අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ ප්‍රතිභා ගුණය ගිරාකරුවා තුළ නො මඳ ව දක්නා ලැබේ. සන්දේශයක් කිරීමේ දී සාමාන්‍යයෙන් සන්දේශකරුවෙකු මහත් අභිරුචියෙන් ම රචනා කරන්නේ ස්ථාන, මාර්ග වර්ණනා සහ ස්වභාව සෞන්දර්ය වර්ණනා වේ. ගිරා සන්දේශයේ තොටගමු විහාර වර්ණනාව මේ සඳහා දෘෂ්ටාන්ත මාත්‍රයක් පමණි:

'පහළ සිතබ හිම හිම සෙල් මහිම හැර
වතළ අහස් ගඟ රළ වැළ පැහැ පැහැර
අඹළ කිරණ පෙණ පෙළ ලෙස නොම වැහැර
උදුළ පොහොය මළු සිරිසර බල වෙහෙර '

(ගිරා සන්දේශය - 212 පද්‍යය)

මෙබඳු නිදසුන් ජයවර්ධනපුර, මඟ පෙර නිමිති, සුනේත්‍රා දේවි පිරිවෙන, සැඳෑ, උදා, වන, තොටගමු පියස වර්ණනා සියල්ලක් තුළ ම පැහැදිලි ව දක්නා ලැබේ. උසස් කවියක් පාඨකයාගේ හැඟීම්, බුද්ධිය මෙන් ම ආත්මය පවා පුබුදුවාලීමට සමත්විය යුතු ය. විස්මය නම් වූ මනෝභාවයෙන් රසය උපදින බව නාරායන් ආචාර්යවරයා පවසා ඇත. ගිරා සන්දේශකරුවා දූත වර්ණනයට යොදාගත් ඉන්ද්‍රිය රූප මගින් එකී විස්මයජනක ප්‍රහර්ෂය ඇති වේ. එය කළ හැක්කේ සහෘදයා තුළ අද්දැකීම පොදු බවට පත් කිරීමෙනි:

'ඉඳු දුනු පැහැ දිනු - තුනුසිරිනු'දුල　　මමිතුර
ළඳ සොඳ අදර වැනි තගේ තෙල තුඩ　　දුටුව
ලොබ බැඳ අදර නො කෙරෙතී කවුරුසතුටු ව?
වන වනපති තුරෙහි - පුර පුරපතිත්　　මැඳුරෙහි

නඳව නිතොර ලැබ පිය පියකර　　පහස
රඳව පවර කෙළි කෙළ කෙළ හැම　　දවස
දිසි දිය කුස හැම සියොතුන්ගෙන්　　සුරු ව
නිසි යසරුස කියවන නුවණින්　　සරු ව
ඉස වරලෙස නිති පණිවායෙන්　　දුරු ව
රිසි පලරස විඳ සතොසින්　　දවසරුව'

(ගිරා සන්දේශය - 02 පද්‍යය)

උත්ප්‍රේක්ෂාලංකාරය ඔස්සේ ගිරා සන්දේශයෙහි ඇතැම් පද්‍යයන්ට ප්‍රතිපාදනය කොටගෙන ඇති දෘශ්‍යාගෝචර වාග්චිත්‍ර එකී අනන්ත ප්‍රතිභාවට දෙස් දෙයි. සැබැවින් ම උත්ප්‍රේක්ෂාව කවියේ මුඛ්‍ය රස භාවය උද්දීපනයට හේතු වන්නා සේ ම ගිරා සන්දේශ කවියාගේ ප්‍රතිභාව සහෘද ලග්න බවට ද එය එක් හේතුවකි:

'සඳ රිවි තමන් රහුමුව පත් වූ　　සඳෙහි
බිඳ ගන අඳුර එළිකරනුව රෑ　　දෙවෙහි
බැඳ සිය කිරණට ගිය මෙන් පහ　　අගෙහි
සොඳ රන් රිදී දද බබළයි　　පුරවරෙහි'

(ගිරා සන්දේශය - 17 පද්‍යය)

කවියාගේ ප්‍රකාශන හුදෙක් අතිශයෝක්තිබර ය. එය යථාර්ථ සම්ප්‍රදායෙහි පිහිටා කළ තාත්වික චිත්‍රයක් ලෙස පෙනෙන තැන් විරල ය. මේ ලක්ෂණය ගිරාවේ බොහෝ කවිවල දක්නා ලැබේ:

'පයියාගල　　වෙහෙර
මුනි රූ බලා　　වෙසෙසින්
වයියා කරන්　　මනරම්
පල්රම් හිසින්　　සතොසින්'

(ගිරා සන්දේශය - 102 පද්‍යය)

එබැවින් ගිරා සන්දේශයේ ප්‍රතිභාව විවරණය කළ යුත්තේ ද සෞන්දර්ය මුසු ආනන්දයකින් ම මිස සත්‍යය කැන්දන, යථාර්ථයකින් නො වන වග දත යුතු ය. ගිරා කවියා ස්වාධීන මඟක් ගන්නේ ඉතා අතළොස්සක් කාව්‍යවල දී පමණි. ගිරාකරු මුළු සන්දේශය පුරාවට ම බහුල ව ම යොදාගන්නේ සංස්කෘත කාව්‍ය බන්ධනයේ දී යොදා ගත් උපමා, රූපක, යෙදුම් සහ සංකල්ප යි. මේ නිසා දේවකථා බහුල රීතියක් ද ගිරාවේ දක්නා ලැබේ. සන්දේශකරුවාගේ අපූර්ව නිසර්ග සිද්ධ ප්‍රතිභාව විහිදෙන පාර්ශ්ව රැසකට ම අපට පිවිසිය හැකි වන්නේ, මේ සියලු ලක්ෂණ කෙරේ අවධානය යොමු කළ විට පමණි.

ගිරා සන්දේශකරුවාගේ ප්‍රතිභාව පිළිබඳ ව දිගින් දිගට ම විමර්ශනය කිරීමේ දී ප්‍රතිභා ශක්තිය ඉස්මතු නො වන ඇතැම් තැන් ද සන්දේශයෙහි තැන තැන හමුවෙයි. සාමාන්‍යයෙන් සංකල්ප රූප නිර්මාණය වන්නේ විෂයානුබද්ධ, අනුභූතිබද්ධ පරිසරයෙනි. එහෙත් කවියා සමහර තැනෙක සුලබ වූ සංස්කෘති කවි සමයන්හි අනුගත සංකල්ප රූප මගින් පමණක් සෑහීමකට පත් ව සිටී. එ නිසා එබඳු කවි තුළින් අනුකාරක සිත මිස ස්වකීය නිසර්ග සිද්ධ ප්‍රතිභා ශක්තියක් විද්‍යමාන වෙතැ'යි කිව නො හැකි යː

'සුරතුරු අයුරු අතු අතැ රැඳි කනාලිය
නිරතුරු සිටින රුසිරි සර මනාලිය
පියකරු මෙරද රුසිරින් මද දිනාලිය
සුරගුරු හට ද ඉන් නොම හැක වනාලිය'

*(ගිරා සන්දේශය - 39 පද්‍යය)*

යම් පද්‍යයක් නිර්මාණය කිරීමට නිර්මාණකරුවාට කාරණාත්‍රයක් බලපායි. ඒවා කවිය සහ කවියා යන ද්විපාර්ශ්වය ම දරා සිටින්නා වූ සුවිසල් කුළුණු තුනක් බඳු ය. ඉන් එකක් හෝ ගිලිහී ගිය විට කවි කල්පනාව සුන්නද්දූලි වෙයි. තවත් අතකින් බලන කල කවියක් බිහි කරන්නට අවශ්‍ය මූලික ම පරිසර සාධකත්‍රය යනුවෙන් මේවා හැඳින්වීම වුව උචිත ය. ඒවා නම්; **සතතාභ්‍යාසය, ව්‍යුත්පත්තික ඥානය සහ ප්‍රතිභාව** යි. ගිරා සන්දේශකරුවා කවුරුන් ද යන්න නිත්‍ය වශයෙන් තව මත් හඳුනාගෙන නො මැත. එහෙත් මෙබඳු උසස් කෘතියක් බිහි කිරීමට තරම් ඔහු සතතාභ්‍යාසයේ යෙදුණෙකු විය යුතු ය. එමෙන් ම ඉතා ඉහළ මට්ටමේ පිටස්තර වූ බාහිර දැනුමකින් ඔහු හෙබි වූවා විය හැකි ය. එහෙත් කතුවරයා කවුරුන් වුවත් කාව්‍යයේ අරමුණු කුමක් වුවත් නිර්මාණාත්මක ව කාව්‍ය ප්‍රබන්ධයේ දී ඒ කිසිවක් බාධා විය යුතු නැත. කාව්‍යයක මුඛ්‍යාධ්‍යාශය සාහිත්‍ය ප්‍රතිනිර්මාණයට බාධාවක් නො කරගත යුතු ය.

කෝට්ටේ යුගයේ පූර්ව සන්දේශ කවීන් සතු ලක්ෂණ රැසක් ම වෙනස් කිරීමට සමත් වෙමින් ස්වකීය කෘතියට නව මුහුණුවරක් දෙමින් ස්වකීය ලේඛනමය ස්වාධීනත්වය සුරකිමින් ඉදිරියට ම ගමන් කරනු ගිරාවේ දක්නට ලැබෙන සුවිශේෂතාවකි. මේ අසහාය ශක්‍යතාව ආරම්භ වන්නේ දස පද සැහැල්ලකින් ආරම්භ වන දූතාශීර්වාදයත් සමඟ ය. දූතයා ගිරවෙකු වුව ද සඳෙස සඳහා තමන් විසින් උපයෝජිත දූතයාගේ යෝග්‍යතාව හැකියාවෙන් මනා කොට අස්තිත්වයට නැංවෙයිː

'සැරද කිර රද සඟ
නන්වන් රුවන් රුවන්
සහකුරු මියුරු තෙපුලෙන්
සව්ලෙව් සතන් හදනා'

*(ගිරා සන්දේශය - 01 පද්‍යය)*

මෙහි 'නන් වන් රුවන් රුවන්' යනු උපමාවකි. එනම්, ගිරවා විවිධ වර්ණ ගත් මාණික්‍ය රූපයක් බඳු යනු යි.

දෘශ්‍ය ගෝචර වාග්චිත්‍රමය උපමාවක් මෙන් ම එහි පද සංඝටනාව තුළින් ම ශබ්ද රසය ද උපදවයි.

අනතුරු ව දූත පැසසුමේ දී කවිසමයානුගත උපදෙස ද රඳවාගෙන කෝෂාර්ථය ඉක්මවා ගිය ධ්වනිතාර්ථය ග්‍රහණය කරවීමට කවියාගේ හෘදය අභ්‍යන්තරයේ භාව පූර්ණත්වයට ඉඩ සලසා දෙයි. එවිට ම විශිෂ්ට ඉන්ද්‍රීය ගෝචර සංකල්ප රූපයක් සහෘදයාට මවාදෙයි:

'ඉඳු දුනු පැහැ දිනු - තුනු සිරිනුදුල　　　　මමිතුර
ළඳ සොඳ අදර වැනි තගේ තෙල තුඩ　　　　දුටුව
ලොබ බැඳ අදර නො කෙරෙතී කවුරු　　　　සතුටු ව '

*(ගිරා සන්දේශය - 02 පද්‍යය)*

දේදුන්නේ ප්‍රභාව පරාජය කළ සිරුරු අලංකාරයෙන් බබළන මාගේ යහළුව, කාන්තාවන්ගේ දෙතොල වැනි ඔබේ තුඩ දුටු කල්හි කවුරු නම් සතුටු ව ලොබ බැඳ ආදරය නො කෙරෙත් ද? කෙතරම් භාව පූර්ණ ඇරඹුමක් ද? විශේෂත්වය නම් කවියා මේ ආරම්භක ප්‍රතිභාව අවසානය දක්වා අවිච්ඡින්න ව රැගෙන යෑම ය. පුර, රජ, මඟ, දියකෙළි, සැඳෑ, උදා, වන, තොටගමු පියස වෙහෙර, ඈ සියලු තන්හි නො සිඳී නො කැඩී ගලා යන්නේ මේ ප්‍රතිභාව යි. අවසන සර්ව ක්ලේෂයන්ගෙන් මිදෙන්නට පාරමී පුරන්නා වූ ශුද්ධ බුද්ධ පුත්‍රයාණන් වහන්සේ නමක් වර්ණනා කර, එකී ප්‍රතිභාව නො අඩු ව ම ඔහු වෙත ලබා දෙයි. වඩා වැදගත් වන්නේ එය උතුරා යන පරිදි දසපද සැහැලිවලින් ම බොහෝ වැනුම් සිදු වීම යි:

'පවර මුනි වදහළ...' (ගිරා සන්දේශය - 250 පද්‍යය)
'සමුදුර හිමි අවට....' (ගිරා සන්දේශය - 251 පද්‍යය)
'පමණින් දස දහස් - යොදුන් වූ දඹදිව සිට...' (ගිරා සන්දේශය - 252 පද්‍යය)

එතරම් වූ භක්තියකින් තොටගමු සිරි රහල් හිමියන් වැනීම තුළින් හෙළි වන්නේ සන්දේශ කවියා රහල් හිමියන්ගේ ගෝලයෙකු නො වුවත් උන්වහන්සේට ඉතා ගරුත්වයෙන් සැලකුවෙකු බව යි.

ඊට ම දෙස් දෙන තවත් කරුණක් ඇත. සැළලිහිණියේ රහල් හිමියන් අනුගමනය කරන්නට කවියා මහත් අභිරුචියක් දක්වා ඇත. ගිරාවේ දළදා වැනුමෙන් හා සැළලිහිණි වටදාගෙයි වැනුමින් එය ප්‍රතීයමාන වේ. පහත දැක්වෙන කවි සංසන්දනය කිරීමෙන් මේ අදහස තහවුරු වේ:

'පෙර උවිඳා ගෙන ගිරිඳා සිඳු　　　　සලත
නැගි පැහැදා පෙණ සමුදා සැටි　　　　නුමුත
මෙන උළිඳා පැහැ විහිදා නෙ දිගු　　　　බිත
සැ දි වටදා ගෙහි වඳු දාගබ　　　　දිමුත්'

*(සැළලිහිණි සන්දේශය - 63 පද්‍යය)*

'පෙර උවිඳා ගෙන ගිරිඳා කිරිසයුර
කලඹන දා නැඟි නො මඳා ගොස අයුර
තුරු සමුදා නඳ ඇමදා දෙන නො හැර
වැද දළදා ගෙට දළදා වඳු මිතුර'

*(ගිරා සන්දේශය - 50 පද්‍යය)*

මෙහෙයින් ම ස්වකීය ඉෂ්ටාර්ථය නාභිගත වන අරමුණිනුත් පෞද්ගලික ගරුත්වය මතත් ගිරාකරුවා සිරි රහල් හිමියන් වැනීම අරුමයක් නො වන්නේ ය. යම් යම් ගතානුගතික සුලබ ලක්ෂණ සහිත ස්ථාන කිහිපයක් හැරෙන්නට ගිරා කවියා අසීමිත ප්‍රතිභාශක්තියෙන් හෙබි වූවෙකු බවට පැහැදිලි ය. ඔහු නාමයෙන් අප්‍රකට ව සිටිය ද ප්‍රතිභාවෙන් සුප්‍රකට වූ කවියෙකුගේ සාහිත්‍යමය පෙළහර පෑමක් වැනි ය.

චිරන්තන සාම්ප්‍රදායික රීත්‍යනුකූල ව ලියැවුණු සියලු ම සන්දේශයන්හි මාර්ග වර්ණනාවක් දක්නා ලැබෙන අතර එහි දී ගමන් ආරම්භයත් ගමනාන්තයත් දක්වාලනු ලබයි. පරෙවි සන්දේශයේ ගමන් මාර්ගය කෝට්ටේ සිට දෙවිනුවර වෙත ය. සැළලිහිණියේ ගමන් මාර්ගය කෝට්ටේ සිට කැලණිය දක්වා ය. කෝකිල සන්දේශයේ ගමන් මාර්ගය දෙවිනුවර සිට යාපා පටුන දක්වා ය. හංස සන්දේශය යැවෙනුයේ කෝට්ටේ සිට කැරගලට ය. පැරණි ම ලාංකේය සන්දේශය වූ මයූර සන්දේශය යැවෙන්නේ ගඟසිරිපුර සිට දෙවිනුවර දක්වා ය. පුරාණ තිසර සන්දේශය යැවෙන්නේ දෙවිනුවර සිට දූතිගම දක්වා ය. මේ අනුව පැහැදිලි වන්නේ මේ සියලු ම ගමන් මාර්ගවල ඓතිහාසික තොරතුරු එක් එක් සන්දේශවල සටහන් වී ඇති බව යි.

ගිරා සන්දේශයේ දූතයා ගමන් ආරම්භ කරන්නේ ශ්‍රී ජයවර්ධනපුරයෙනි. ඔහුගේ ගමනාන්තය තොටගමුව යි. ජයවර්ධනපුරයෙන් පිටත් ව ඉනික්බිති ව,

1. **කෝන්ගස් සෙවණ**
2. **යටියන**
3. **පැපිලියාන**
4. **අත්තිඩිය**
5. **මොරටු එළිය**
6. **පාණදුරේ**
7. **පොතුපිටිය**
8. **කළුතොට**
9. **කළුගඟ**
10. **කලමුල්ල**
11. **පයියාගල**
12. **මග්ගොන**
13. **බේරුවල**
14. **බෙන්තොට**
15. **වනවාසේ**
16. **පරතරතය**
17. **වැලිතොට**
18. **මහදම් පා මෝදර**
19. **කහව**
20. **තොටගමුව** දක්වා

ගිරා සන්දේශකරුවාගේ ගමන් මාර්ගය යි. මේ අනුව පැහැදිලි වන්නේ රමණීයතම පද්‍ය සාහිත්‍ය යුගයේ අඥාත කතුවරයකු විසින් රචිත වුව ද ගිරා සන්දේශය වනාහි කෝට්ටේ යුගයේ බිහි වූ ප්‍රතිභාපූර්ණ පංච සන්දේශ අතුරින් ප්‍රමුඛස්ථානයක් ගන්නා තවත් එක් සන්-දේශයක් බව යි.